# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත පදවාගෙන යා හැකි සිරස් කුඹ ඔසවන (DRIVABLE VERTICAL MAST LIFTS) 08 ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය

## IFB අංකය - SRS/F.8040

1. ශ්‍රී ලංකාව, කොළඹ, තැ. පෙ. 355, දුම්රිය මූලස්ථානය, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු (මහා) ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත පදවාගෙන යා හැකි සිරස් කුඹ ඔසවන (Drivable Vertical Mast Lifts) 08 ක් සැපයීම සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.
2. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.
3. අභිලාෂී යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට සතියේ දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පහත සඳහන් ලිපිනයේදී වැඩිමනත් විස්තර ලබාගැනීමටත් ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් හැකිය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

**දුරකථන අංක** : **94(11)2438078 හෝ 94(11)4600202**
**ෆැක්ස් අංකය** : **94(11)2432044**
**ඊමේල්** : **srs.slr@gmail.com,tender1@railway.gov.lk**
**වෙබ් අඩවිය** : **www.railway.gov.lk**

4. පදවාගෙන යා හැකි සිරස් කුඹ ඔසවන (Drivable Vertical Mast Lifts) සැපයීම සම්බන්ධයෙන් වසර 10 ක පළපුරුද්දක් ඇති පසුගිය වසර 10 තුළ අවම වශයෙන් Mast Lifts 20 ක් විකුණා සම්පූර්ණ කළ හා අවම වශයෙන් වසර 5 ක් සඳහා අදාළ නිෂ්පාදකයගේ දේශීය නියෝජිතායතනයක් ඇති ලංසුකරුවන් ලංසු ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම් ලබයි.

   සමාන සන්නාමයෙන් යුත් Mast Lifts නිෂ්පාදනයේ හා සැපයීමේ වසර 10 ක පළපුරුද්දක් ඇති පදවාගෙන යා හැකි සිරස් Mast Lifts සැලසුම් නිර්මාණය හා නිෂ්පාදනය සඳහා ISO 9001:2008 තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් නිෂ්පාදකයින් වීම යෝග්‍යතා අවශ්‍යතාවකි.
5. අභිලාෂී ලංසුකරුවන්ට ශ්‍රී ලංකාව, කොළඹ -10, ඕල්කොට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා රු. 10,250/= ක ආපසු නොගෙවන ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2025.06.18 දින සිට 2025.07.14 දින ප.ව. 3.00 දක්වා ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.
6. සැම ලංසුවක් සමගම ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය. ලංසු සුරක්ෂණයේ වටිනාකම රු. 500,000.00 ක් වන අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත කළ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැංකුවකින් නිකුත් කළ කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතුය.
7. ලංසු, 2025.07.15 දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර පහත ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතු අතර, ලංසු භාරගැනීමේ වේලාව අවසාන වූ වහාම ලංසු විවෘත කෙරේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වන මෙන් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

**සභාපති, දෙපාර්තමේන්තු (මහා) ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,**
**ඕල්කොට් මාවත, කොළඹ 10.**

**යොමු අංකය : SRS/F.8040**

**සභාපති,**
**දෙපාර්තමේන්තු (මහා) ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**